සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி | SAMAGI JANA BALAWEGAYA

2024.06.06

සුදර්ශන ගුණවර්ධන මහතා,
සභාපති,
ස්වාධීන රූපවාහිනිය,
වික්‍රමසිංහපුර,
බත්තරමුල්ල.

සභාපතිතුමනි,

**යෝජිත රූපවාහිනි සංවාදය පිළිබඳව.**

උක්ත මැයින් 2024.06.04 වන දින ගරු විපක්ෂ නායකතුමා වෙත ඔබ විසින් යොමුකරන ලද ලිපිය හා බැඳේ.

ඔබගේ ලිපියෙහි පළමුවන ඡේදයේ සඳහන් කොට ඇති පරිදි 2024.03.21 වන දින පාර්ලිමේන්තුවේදී මවිසින් ආරාධනා කලේ විපක්ෂ නායකතුමා සහ අනුර කුමාර දිසානායක මහතා අතර විවාදයකට නොව සමගි ජන බලවේග ආර්ථික කමිටුව සහ ජාතික ජන බලවේග ආර්ථික කමිටුව අතර පවත්වනු ලබන විවාදයකටයි.

එදින පාර්ලිමේන්තු වාර්තා කිරීමේදී ඔබගේ ආයතනය විසින් පහසුකම් සැලසීම සඳහා ඉදිරිපත් වූයේ එම යෝජනාවටය.එනම් සමගි ජන බලවේගයේ සහ ජාතික ජන බලවේගයේ ආර්ථික කමිටුව අතර පවත්වනු ලබන විවාදයකටයි.

නමුත් ජාතික ජන බලවේගය විසින් එම විවාදය පිළිබඳ කිසිඳු ඉදිරිපත් වීමක් සිදු නොකොට පක්ෂ නායකයින් අතර විවිදයන් සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.එම යෝජනාව අපගේ පක්ෂ නායකත්වය විසින් පිළිගත් අතර එම විවාදය පැවැත්ම සඳහා පූර්ව කොන්දේසියක් ලෙස ඉදිරිපත් කැරනු ලැබුවේ පක්ෂ දෙකෙහි ආර්ථිකකමිටු විවාදය පළමුවත් දෙවනුව නායකත්ව විවාදයත් පැවැත්වීමටයි.එමෙන්ම මෙම විවාද සම්බන්ධීකරණයට සහ අවශ්‍ය අනෙකුත් කොන්දේසි හා වැඩසටහන් ආකෘතිය පිළිබඳ මැදිහත් පාර්ශවයක අවශ්‍යතාවයද පෙන්වා දෙමින් අප විසින් එයට දායකවන ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමයද ලිඛිත ආරාධනාවක් යොමු කරන ලදි.

නමුත් ජාතික ජන බලවේගය ඒ පිළිබඳ සාධනීය ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. එනමුත් මෙම විවාද පිළිබඳ දිගින් දිගටම සිදුකල අදහස් හුවමාරු පදනම් කර ගනිමින් මවිසින් ආර්ථික කමිටු විවාදයට සුදුසු දින 05 කුත් (2024 මැයි මස 27/28/29/30/31) නායකත්වය විවාදය සඳහා සුදුසු දින 05 (2024 ජූනි මස 03/04/05/06/හෝ 07) යෝජනා කල අතර එහිදී ද අපගේ ස්ථාවරය වූ පළමු ආර්ථික කමිටු විවාදය සහ දෙවන නායකත්ව විවාදය යන්න අනිවාර්ය කොන්දේසියක් ලෙස ඉදිරිපත් කොට ඇත.

සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி | SAMAGI JANA BALAWEGAYA

එම අදහස නොසලකා හරිමින් නායකත්ව විවාදයට එකඟ වු බව ජාතික ජන බලවේගය විසින් ප්‍රකාශයට පත්කොට ඇත.එමෙන්ම මෙම විවාද පැවැත්වීම පිළිබඳ අප දෙපාර්ශවය අතර පූර්ව සාකච්ඡා පවත්වා ඒ පිළිබඳ වැඩසටහන් සැකැස්ම ආදිය සිදු කිරිමට අප විසින් යෝජනා කොට ඇත. නමුත් ඒ කිසිඳ යෝජනාවකට යහපත් ප්‍රතිචාර නොදක්වා ජාතික ජන බලවේගය එකඟ වු දිනය පදනම් කර ගෙන මෙම සංවාදය පැවැත්වීමට ඔබගේ නාලිකාව සුදානම් යැයි පැවසීම විධිමත් සැලසුම් සහගත ක්‍රමවේදයක් අනුගමනය නොකොට සිදු කල ප්‍රකාශයක් බව සඳහන් කරනු කැමැත්තෙමි.මෙම විවාද පැවැත්වීමේදී අපගේ යෝජනාව වනුයේ සියලුම විද්‍යුත් නාලිකා, මුද්‍රිත මාධ්‍ය සමඟ සියල්ලන් එකඟවන පොදු ස්ථානයක පැවැත්වීම බව ද අවධාරණය කරමි.

මෙම විවාදය පිළිබඳ පසුගිය කාලය තුල අප විසින් යොමු කල අදහස් හා යෝජනා පිළිබඳ ඔබගේ අවධානය යොමු කොට ක්‍රියා කිරීම වැදගත් වේ. එම කාල සිමාව තුල විවාදය පිළිබඳ ජාතික ජන බලවේගයට යොමුකල යෝජනා ඇතුළත් ලිපි ලේඛණවල පිටපත් මේ සමග ඔබ වෙත යොමු කරනුයේ විවාදය පිළිබඳ යථා ස්වරූපය අවබෝධ කර ගැනීම පිණිසය.

**නලින් බණ්ඩාර(පා.ම)**
මෙහෙයුම් ප්‍රධානී/
විවාදය පිළිබඳ සම්බන්ධීකාරක,
සමගි ජන බලවේගය.

**සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.**
ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.
Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.
**+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com**